රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 11/2013

මගේ අංකය : EST-7/LEAVE/03/3221
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2013.07.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.</u>**

ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 22 වෙනි වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම වගන්තියේ 22:7 උප වගන්තියට පසුව රජයේ නිලධරයෙකුගේ දරුවෙකුගේ හෝ කලත්‍රයාගේ අසනීපයක් වෙනුවෙන් වැටුප් රහිත නිවාඩු ලබාදීමේ විධිවිධාන ඇතුළත් කර ආයතන සංග්‍රහය සංශෝධනය කිරීමට 2013.05.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව 22:8 හා 22:8:1 යනුවෙන් නව උප වගන්ති 2ක් පහත සඳහන් පරිදි එකතු කරමින් ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 22 වෙනි වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

22:8 රජයේ නිලධරයෙකුගේ අවිවාහක දරුවෙකු හෝ කලත්‍රයා අසනීප වීම මත රජයේ රෝහලක විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය පරිදි වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා උපරිමය එක් අවුරුද්දක් දක්වා වැටුප් රහිත නිවාඩු දේශීයව හෝ විදේශීයව ගත කිරීම පිණිස අනුමත කළ හැක.

22:8:1 මව සහ පියා දෙදෙනාම රජයේ නිලධරයන් වන්නේ නම් රෝගී දරුවෙකු රැක බලා ගැනීම වෙනුවෙන් ඉහත 22:8 හි සඳහන් නිවාඩුව ලබා ගත හැක්කේ දෙදෙනාගෙන් එක් නිලධරයෙකුට පමණි.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය